# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2180/38 - 2020 ජුනි මස 19 වැනි සිකුරාදා - 2020.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයකු ලෙස පත්වූ සීනිතම්බි වේවි අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂයේ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තවරාජා ෂරන්යා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් තවරාජා ෂරන්යා, ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**තිළිණ වික්‍රමරත්න,**
තේරීම්භාර නිලධාරි,
ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාව.

2020 ජුනි මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

07 - 197

1A - G 32375 — 27 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*